# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 588/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 05/04/2024 පැය1525

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.04.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 60 | 280 | තඹ දඟර 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධී දුම් වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.04.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කඩවත පොලිස් වසමේ මහර, කඩවත ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධි දුම් වැටි 1000ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන මහර,කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. කඩවත පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.04.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්බලන්ගොඩ පොලිස් වසමේ ඉඩම්තොට,අම්බලන්ගොඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 35 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24ක් හා 25ක් වන වන අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන්වේ. අම්බලන්ගොඩ පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුර.**

2024.04.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීටියාගොඩ පොලිස් වසමේ මහවත්ත, මීටියාගොඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51ක් වන වන හසලක ප්‍රදේශයේ පදිංචිකරුවන්වේ. මීටියාගොඩ පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2024.04.04 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හසලක පොලිස් වසමේ කොටිකාපොලලන්ද ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 59 මිලි ග්‍රෑම් 700 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන හසලක පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46ක් වන වන හසලක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. හසලක පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවි 04ක් සමඟ සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර.**

2024.04.04 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පොතුවිල් පොලිස් වසමේ ලාහුගල, හුලංනුගේ,හැඩඔයයාය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 04ක් සමඟ සැකකරුවන් 04 දෙනෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24ත් 46ත් අතර වයස් වල පසුවන හුලංනුගේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. පොතුවිල් පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**